## අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

**සිංහල I** | පැය තුනයි

උපදෙස් :
* පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන උද්ධෘත කියවා ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

(අ) කල් යාමකින් සොත්ථිසේන නම් යුවරජහට අසාධ්‍ය වූ කුෂ්ඨ රෝගයක් ඇති වූයේය. එකල්හි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දඹදිව ප්‍රසිද්ධ බොහෝ වෙදවරුන් ගෙන්වා පිළියම් කරවාත් සමනය කොටගත නොහී අසාධ්‍යයහ යි අළහ. සොත්ථිසේන නම් රජහුගේ ශරීරය එකහී පැළී පෙරළී දිය බසින්නට පටන් ගත්තේ ය. එකල්හි ලජ්ජාව "අනුන්ට පිළිකුල් ව ගවර වළෙක්හි හුණු ගෝකුණපයක් මෙන් මෙ බඳු කුණප ශරීරයෙහි පිළිකුල් ව මෙබඳු ව්‍යාධියෙන් පෙළෙන්නා වූ මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිමෙක් ද?''

(i) සොත්ථිසේන රජුට වැළඳුණේ කෙබඳු රෝගයක් ද?

(ii) රෝගය පිළිබඳ ව දඹදිව ප්‍රසිද්ධ වෛද්‍යවරුන්ගේ නිගමනය වූයේ කුමක් ද?

(iii) තම රෝගය නිසා සොත්ථිසේන රජු තුළ ඇති වූ හැඟීම කෙබඳු ද?

(iv) '**ගවර වළෙක්හි**', '**ගෝකුණපයක්**' යන පදවලට අර්ථ සපයන්න. (ලකුණු 04යි)

(ආ) ඒ වේලාට ගසන විදුලියෙන් හා මේඝනාදයෙන් හා වස්නා වැස්සෙන් ආකාශය අතුරු සිදුරු නැති විය. ඒ වේලාට ම පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ විළිත් පහරනට වන. ආස ගුගුරන්නා සේ හඬගසන්ටත් වන. වස්නා වැසි බෝවා සේ ම ප්‍රසවදුකුත් බෝ විය. සමුණන් බණවාලා 'විළිත් පහරන්ට වන. ශීත වඩා බලවත් හෙයින් ඇල් වැදපියා විළිත් ලාගත නොහෙමි. නොතෙමී වදාපියන තැනක් ඉදි කරව'යි කිවුය. උයිත් දණ්ඩක් පතක් කපාගන්නට නිසි යකඩයක් හැරගෙන දඬුපත් බලා ඇවිදිනෝ තුඹසක් පිට සිටි කැළයක් දැක දණ්ඩක් පතක් කපන්ට වන්හ. ඒ කපන සොල්මනට තුඹසින් නයෙක් අවුත්ලා දඬු කපන තැනැත්තවු කාපීය.

(i) ආකාශය අතුරු සිදුරු නැති වීමට හේතු වූ කරුණු මොනවා ද?

(ii) පටාචාරාවගේ විළි පැහැරීම, හඬ ගෑසීම හා ප්‍රසව දුක සමඟ සංසන්දනය කරන ස්වාභාවික පරිසරයේ සිදුවීම් පිළිවෙළින් නම් කරන්න.

(iii) පටාචාරා තම ස්වාමියාගෙන් ඉල්ලා සිටියේ කුමක් ද?

(iv) '**තුඹසින්**' යන පදයෙහි ව්‍යාකරණ ලක්‍ෂණය දක්වන්න. (ලකුණු 04යි)

(ඉ) රසයෙන් උද්දාම වූ නොයෙක් සූපව්‍යංජනයෙන් යුක්ත බත් අවුළු ආදියෙන් මෙහෙ නිමවා සතුටු වූ රජ්ජුරුවෝ 'මෙබඳු මේ කුමාරිකාව පරීක්ෂා නොකොට මපුතණුවන් කෙරෙන් මඳකින් පහ කෙළෙම් වෙමි' යි සිතමින් දෙමහල්ලන් ළඟට කැඳවා අවවාද කොට 'මූ ඉතා ආශ්චර්යවත් කුමාරිකා කෙනෙකැ'යි කියමින් එම විට රුවන් රැසක් පිට සිටුවා අභිෂේක මඟුල් කොට සාලිරාජ කුමාරයන්ට පාවා දී තමන්ගේ මාලිගාවට ම ගියහ. අසෝකමාලා දේවි රජ්ජුරුවන් මෙහෙ නිමවූ පරිද්දෙන් ම රජ ඇමැතියන් හා මහසෙනඟ ද බත් කැවූහ. එකල ඔහු කුමාරිකාවන්ගේ ගුණ කියා ස්තුති කරන්නාහු 'මේ ලෝකයෙහි සියලු සත්ත්වයෝ ම නොයෙක් අභිවෘද්ධි සඳහා ගෝකුණෙහි උපනද ගොරද නොදමා ඇරගනිති. ගෝකුණ එසේ නොගන්නාහු ම ය. එසේ හෙයින් උපන් ජාතිය කුමක් කෙරේද? ගුණ ම වේද උතුම් වන්නේ ය' යි කිය කියා වර්ණනා කෙරෙමින් ගියාහ.

(i) මෙහෙ නිමවීම සඳහා රජු වෙනුවෙන් පිළියෙල කළ ආහාර මොනවා ද?

(ii) අසෝකමාලා කෙරෙහි රජතුමා ප්‍රසාදය පළ කළේ කෙසේ ද?

(iii) උපන් ජාතිය වැදගත් නොවන බවට මෙහිදී ඉදිරිපත් කර ඇති නිදසුන කුමක් ද?

(iv) '**මෙහෙ නිමවා**', '**ආශ්චර්යවත්**' යන පදවල අරුත් දක්වන්න. (ලකුණු 04යි)

[2 වැනි පිටුව බලන්න

(ඊ) නඳනා දන නෙත් පැහැ ලනු ලා සිට
අදනා මෙන් තම තම වෙත දෙ තරට
පිහිනා යන එන අඟනන් දිය පිට
බඳනා වැනි රන් හේ තොප යතුරට

සෙදනා ලොවිනා ළඳුනා ලෙසිනා
රළිනා ලෙළෙනා සොබනා ගතිනා
නඳනා ගඟනා කෙළනා ලියනා
දකිනා මතිනා හදනා තොසිනා

(i) **'පිහිනා යන එන අඟනන්'** මෙහි උපමා කොට ඇත්තේ කුමකට ද?
(ii) හදෙහි සන්තෝෂයක් ඇති වන්නේ කවර දෙයක් දැකීම නිසා ද?
(iii) **'රළිනා ලෙළෙනා'** යන්නෙහි අරුත් දක්වන්න.
(iv) **'දන නෙත් පැහැ ලනු'** යන්නෙහි කාව්‍යාලංකාරය කුමක් ද? (ලකුණු 04යි)

(උ) පහත දැක්වෙන උද්ධෘතයන් අතරින් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) ''වේලා නොවරදවා මෙතෙක් කතර යා හැකිද?''
(ii) ''සියලු වැව් පොකුණු හා කඳුරැළි ආදිය ප්‍රසන්න ජලයෙන් පිරී සිටිනේය''
(iii) ''එබැවින් කල් තබා ගෙවලට වැද දොරවල් වසාගෙන බැණ නොනැඟී හිඳුව''
(iv) ''මට ඒක තේරුණා. ඇයි එහෙම නම් මට එන්නෙයි කිව්වෙ?''
(v) ''මට තාත්තා එනකං මුහුද දිහා බලාගෙන ඉන්න තියෙනවා''
(vi) ''මේ වගේ පෙරළිකාරයින්ට මොනවද කරන්ඩ බැරි?'' (ලකුණු 08යි)

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් ලියන්න.

තැනින් තැන ඉරී ගිය, කිලිටි වී ගිය ගවොම
දවස් ගණනාවකින් තෙල් පොදක් නොදුටු හිස
එක අතෙක ඉරී ගිය පරණ පත්තර පිටුව
ඈ සිටී අවන්හල දොරකඩෙහි හැමදාම

උයා ඇති මුත් රසට මගෙ දිවා භෝජනය
එපා වී ගියේ කිම
හදවතේ ඇඳුණා ද ඇගේ අසරණ දෙනෙත
කිසි දිනෙක ඇසෙන්නට ගායනා නොකළ ඇගෙ
සිහින් සෝබර ගීය ඇසුණා ද, දෙසවනට

සති අන්තයෙ දිනෙක කුඩා දියණියන් හට
අනෙක මසවුළු සමඟ බත් කටක් කවන්නට
කොතෙක් දරමි ද වෙහෙස
කුඩා දෑතෙහි රැඳෙන ඇගෙ දිවා භෝජනය
ගේ පුරා විසිර යයි

අවන්හල දොරකඩෙහි නෙත් අයා සිටින්නී
බත් උළක් වැටෙන තෙක් ඉරුණ කඩදාසියට
කෙසේ නම් වෙනස් වෙද මගේ දියණිය ඇයට
දෙදෙනාම එකම එක අහස යට උපන් කල (ලකුණු 16යි)

**2.** ''ධර්මසේන හිමි උපහාසය ඉස්මතු වන අයුරින් කථා වස්තු ඉදිරිපත් කළ ද චරිත නිරූපණය කළේ සානුකම්පිත දෘෂ්ටියකිනි.'' සද්ධර්මරත්නාවලියේ නියමිත කථා ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

**නැතහොත්**

''එදිනෙදා ජීවිතයේ දී අපට හමුවන කවර අන්දමේ චරිතයක් වුව ද ජාතක කථාවලින් සොයා ගැනීම දුෂ්කර වූවක් නොවේ.'' නියමිත ජාතක කථා **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

[3 වැනි පිටුව බලන්න

**3.** සද්ධර්මාලංකාර කතුවරයා චරිත හා අවස්ථා නිරූපණයේ දී සාහිත්‍ය රසය ජනනය කිරීම සඳහා කොතෙක් දුර සමත් ව ඇත් දැයි නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

**4.** ''ගිරා සන්දේශයෙහි ස්වභාව සෞන්දර්ය වර්ණනා ඉදිරිපත් කෙරෙන්නේ පාඨකයා තුළ සජීවී සංකල්ප රූප මැවෙන ආකාරයෙනි.'' නියමිත වැනුම් **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

**5.** ''මනා හේතුඵල සම්බන්ධතාවකින් යුක්තව කථා වස්තුව විකාශනය කිරීම නිසා මළගිය ඇත්තෝ යථාර්ථවාදී නව කතාවක් වශයෙන් පාඨකයාගේ සිත් ගනී.'' නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

**6.** ''නූතන කෙටිකථාකරුවාගේ අවධානය යොමු වී තිබෙන්නේ ග්‍රාමීය සහ නාගරික ජන සමාජයන්හි ඇගයීම් හා ආකල්පවල පවත්නා වෙනස ප්‍රතිනිර්මාණය කිරීම කෙරෙහි ය.'' නිර්දිෂ්ට කෙටිකථා **දෙකක්** ඇසුරෙන් මේ මතය විමසුමට ලක් කරන්න. (ලකුණු 15යි)

**7.** ''නූතන කවීහු විවිධ අත්දැකීම් ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත ආකෘතියක් නිපදවා ගැනීම කෙරෙහි සිය අවධානය යොමු කළහ''. නිර්දිෂ්ට පද්‍ය පන්ති ඇසුරෙන් මෙම අදහස සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

**8.** ''උදයන චරිතය නිරූපණය කිරීමේ දී රත්නාවලී කතුවරයා වැඩි වශයෙන් අවධානය යොමු කරන්නේ රජුගේ කෙළිලොල් බව හා රාගික ගති ලක්ෂණ විදහාපෑම කෙරෙහි ය.'' විමසන්න. (ලකුණු 15යි)

***

# අ.පො.ස.(උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

**සිංහල II** | **පැය තුනයි**

උපදෙස්:
* I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා** භාර දෙන්න.

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

**1.1.** ඌෂ්මාක්ෂර **පමණක්** ඇතුළත් වන වරණය කුමක් ද?
(1) ඞ, ඤ, ණ, න, ම (2) ඟ, ඦ, ඬ, ඳ, ඹ (3) ශ, ෂ, ස, හ, ෆ
(4) ක, ච, ට, ත, ප (5) ට, ඨ, ඩ, ඪ, ණ (........)

**1.2.** නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) වීරෝදාර, ප්‍රතිඵල, ශීඝ්‍ර, ශිෂ්ටාචාරය (2) ප්‍රශ්ණ, ආශ්වාස, ළමයා, දර්ශනය
(3) විශිෂ්ට, ශ්‍රේෂ්ඨ, ජ්‍යෝෂ්ඨ, කණිෂ්ඨ (4) කොට්ඨාසය, ප්‍රස්ථාරය, පුස්තකාලය, මර්දනය
(5) ප්‍රදානය, අත්‍යාවශ්‍ය, වර්ධනය, ලේඛණ (........)

**1.3.** අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) මහින්ද හිමි, රැයිපියල් තෙන්නකෝන්, අල්විස් පෙරේරා, විමලරත්න කුමාරගම
(2) කුමාරතුංග මුනිදාස, ආනන්ද රාජකරුණා, සිරි ගුණසිංහ, ආරියවංශ රණවීර
(3) විමල් දිසානායක, පරාක්‍රම කොඩිතුවක්කු, බුද්ධදාස ගලප්පත්ති, සාගර පලන්සූරිය
(4) එරික් ඉලයප්ආරච්චි, නන්දන වීරසිංහ, යමුනා මාලිනී පෙරේරා, රත්න ශ්‍රී විජේසිංහ
(5) චන්ද්‍රරත්න මානවසිංහ, දයාසේන ගුණසිංහ, ගුණදාස අමරසේකර, මීමන ප්‍රේමතිලක (........)

**1.4.** පහත සඳහන් වරණ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රකාරාංශය යනු සිංහල 'ෂ' කාරය සඳහා යොදන සංකේතය යි.
(2) රකාරාංශය යංශය සමඟ යෙදෙ යි.
(3) රකාරාංශය රේඵය වෙනුවට යෙදිය හැකි යි.
(4) රකාරාංශය පදයක මුලට පමණක් යෙදෙ යි.
(5) රකාරාංශය 'ර' ශබ්දය වෙනුවට යෙදෙන සංකේතය යි. (........)

**1.5.** රේඵය, යංශය, රකාරාංශය හා ගයනුකිත්ත සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ගෞතම, වර්ණය, ඓක්‍යය, ප්‍රමාණය (2) මාර්ගය, මධ්‍යස්ථානය, ශාස්ත්‍රය, ලෞකික
(3) තර්කය, වෛද්‍ය, භෞතික, ප්‍රකාශනය (4) ධර්මය, කෞතුකාගාරය, අනිත්‍යය, පරාක්‍රම
(5) වක්‍රය, පෞරුෂය, සෞඛ්‍යය, වර්ගය (........)

**1.6.** එකිනෙකට අනුරූප වන සේ වචන යුගල **යෙදී** ඇති වරණය තෝරන්න.
(1) විදේශ ප්‍රවෘත්ති, චන්ද්‍ර මණ්ඩලය, රාජ්‍ය සභාව, අමාත්‍ය මණ්ඩලය
(2) විහාර මන්දිරය, ත්‍යාග ප්‍රදානය, යෞවන කටයුතු, හිරු මඬල
(3) ශුභ මඟුල, ධර්මද්වීපය, මුසුකිරිය, බ්‍රහ්ම ලෝකය
(4) ශුභ ප්‍රාර්ථනා, ස්වභාව දහම, මැති සබය, වියරණ විදි
(5) දළදා මැදුර, අටලෝදහම, සන්ධ්‍යා පුවත්, දක්ෂිණ අධිවේගී මාර්ගය (........)

**1.7.** තත්සම වචන **පමණක්** අන්තර්ගත වරණය කුමක් ද?
(1) ධර්ම, ගුප්ත, ශීර්ෂ, නුවන (2) වලාකුළ, ආශ්චර්ය, සූර්ය, සේසත
(3) අරම, ලෝකය, කාර්ය, ආසිරි (4) ප්‍රදර්ශන, වෛශාඛ, ප්‍රෞඪ, කෞශල්‍යය
(5) ගවේෂණය, විමර්ශනය, තාක්ෂණය, සඳගල (........)

**1.8.** මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) අධම - උත්තම, උසස්, ශ්‍රේෂ්ඨ, උත්කෘෂ්ට (2) ආරම්භය - අවසානය, කෙළවර, නිමාව, සමාප්තිය
(3) පණ්ඩිත - මෝඩ, බුද්ධිමත්, අඥාන, අව්‍යක්ත (4) කසළ - නිකසළ, පිරිසිදු, පවිත්‍ර, නිර්මල
(5) ප්‍රකට - අප්‍රකට, අපැහැදිලි, සැඟවුණු, අප්‍රසිද්ධ (........)

**1.9.** මුලින් දැක්වෙන පදයට **සමානාර්ථ** පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) කෝමල - මොළොක්, සිනිඳු, මෘදු, සියුමැලි (2) පන්සල - පර්ණශාලාව, ආරාමය, අසපුව, ආරණ්‍යය
(3) මාලිගාව - මන්දිරය, ප්‍රාසාදය, විමානය, භවන (4) සම්ප්‍රාප්තිය - ළංවීම, ආගමනය, පැමිණීම, එළඹුම
(5) ප්‍රවීණ - ප්‍රගුණ, පුහුණු, සමර්ථ, දක්ෂ (........)

[2 වැනි පිටුව බලන්න

**1.10.** **විභක්ති, විශේෂණ, දකාරාර්ථ,** අව්‍යය යන සමාසවලට අයත් පද **පිළිවෙළින්** දක්වා ඇති පේළිය තෝරන්න.
(1) ගුරු පඬුරු, මල් හිනාව, සුදන, ගුරු දෙගුරු (2) කිරිබත්, රතුරෝස, මල්පහන්, තිනෙත්
(3) කහ කුරුල්ලා, එළුමස්, ඇළදොළ, කුකවි (4) දසසිල්, ඉරහඳ, බවදුක්, අකීකරු
(5) මිහිඳුම්, රහල්තෙර, නළුනිළි, අපමණ (........)

**1.11.** කෘදන්ත පදයක් අන්තර්ගත නො වන වරණය තෝරන්න.
(1) කරන, බලන, හඬන, සවන (2) නැටූ, බැලූ, කියූ, දැරූ
(3) නැසුණු, පිපුණු, ලියවුණු, බිඳුණු (4) ගැරහුම්, රැවුම්, ඇනුම්, සිතුම්
(5) නිදනා, රකිනා, දරනා, බස්නා (........)

**1.12.** පහත සඳහන් වැකිවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් **ක්‍රියා වර්ගය** පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
* ගුරුවරයා **පැමිණෙද්දී** ළමයි නැගී සිටිති.
* අම්මා අවුරුදු නැකතට අලුත් ළිපක් බැඳ ගිනි **මොළවයි.**
* මල්ලී මියුරු ගී **කියමින්** නටයි.
* කවීහු නිර්මාණ සඳහා නව අනුභූතීන් සොයා **යති.**
(1) අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(2) මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(3) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
(4) පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(5) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා (........)

**1.13.** **අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක්** ඇති පේළිය තෝරන්න.
(1) ළමයි, ශිෂ්‍යයෝ, ක්‍රීඩකයෝ, ගායිකාවක (2) මං, ඔවුන්, අප, තෝ
(3) අයෙකු, කිසිවෙක්, කවරෙකු, ඇතමුන් (4) ගුරුවරියක්, මවක්, දුවණියක්, හිතවතියක්
(5) බාලිකාවන්, මැතිවරු, දෙමාපියෝ, යෙහෙළියන් (........)

**1.14.** **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.
(1) උපගුරු, සාදරයෙන්, අධිවේගී, අණුදක්නය (2) අත්‍යුදාර, අස්වාභාවික, දුර්භාග්‍ය, විරාගය
(3) අවගුණ, අපකීර්තිය, අනුනායක, නිකසළ (4) ප්‍රසිද්ධ, නිර්වින්දන, නිශ්ශබ්ද, දුස්සාධ්‍ය
(5) සුදන, අවලෝකනය, විමල, අබිමන් (........)

**1.15.** **කොමලඟනක** වුවනත උඩුකුරු කොට
තම **මුහුළත් බැඳ** පිහිනනු දිය පිට

යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරින් මුද්‍රිත පද** අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, පූර්වක්‍රියා, තද්ධිත (2) සන්ධි, තද්ධිත, පූර්වක්‍රියා (3) තද්ධිත, පූර්වක්‍රියා, සන්ධි
(4) පූර්වක්‍රියා, සන්ධි, තද්ධිත (5) පූර්වක්‍රියා, තද්ධිත, සන්ධි (........)

**1.16.** ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය තෝරන්න.
(1) ඔවුනොවුන්, උනුන්, එකිනෙකා, එදිනෙදා (2) රන් කුඩුව, ගුරු ගෙදර, ගත්කරු, වනමල්
(3) වහා, අහා, මෙන්, හා (4) කියමින්, තබමින්, බඳිමින්, කෙළිමින්
(5) ගැමි, දැහැමි, ඇහැටි, තොටි (........)

**1.17.** **සමාස පදයක් ඇතුළත් නොවන** වරණය තෝරන්න.
(1) ඇළදොළ, ගස්වැල්, ඉරහඳ, නළුනිළි (2) අපරාජිත, අපමණ, අපකීර්ති, අපහරණ
(3) සිහිල් පැන්, නිල් අහස, තුන්දොර, වරලස (4) කම්කරු, ළමාපොත්, වේපස්, දිය කිඳුරා
(5) දෙදණ, සිවුපා, අට දිග, දසපණත (........)

**1.18.** **එකම වර්ගයට අයත් සන්ධි** පද අන්තර්ගත වරණය තෝරන්න.
(1) සුළංපහර, වළන්කැබලි, ගංමෝය, බිංකරුවල
(2) පුදසුන, යථාවබෝධය, පිළිතුරු, අරුණලු
(3) කර්මානුරූප, පරාවර්තනය, නිලඹර, සුරාසුර
(4) නුවණැති, නළඟන, රුවැති, දකුණැස
(5) යන්ත්‍රෝපකරණ, මාර්ගෝපදේශ, දේශානුරාගය, පුණ්‍යෝත්සවය (........)

**1.19.** ව්‍යාකරණානුකූල ව **නිවැරදි වාක්‍යය** තෝරන්න.
(1) තරගය ජයගත් ක්‍රීඩකයෝ මහත් හරසරින් පිළිගනු ලැබූහ.
(2) තම පාසලේ ගුරුවරු හොඳින් කටයුතු කරති යි විදුහල්පතිතුමා පැවසී ය.
(3) මේ තරගයෙන් කවුරුන් ජය ගනිත් ද?
(4) සියලු සාමාජිකයෝ රැස්වීමට පැමිණ ඇත.
(5) කුමරතුඟු මුනිදසුන් හෙළ බසට විශාල සේවයක් සිදු කළ හ. (........)

**1.20.** **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) වර්තමානයේ දී ව්‍යාපාර ක්ෂේත්‍රයතුළ විශේෂ අවධානයක් යොමුකළහැකි වනුයේ මානවසම්පත කෙරෙහි ය.
(2) ඥාන විභාගය යනු දැනුම පිළිබඳ විග්‍රහයවන අතර එය දර්ශන විෂයයේ උප විෂයයකි.
(3) සෙල් ලිපි ආදිය රටපුරා බහුලව ලියවුණේ ඒවා කියවා තේරුම්ගැනීමට හැකි බහුතරයක් රටේසිටි නිසා ය.
(4) පහළොස්වන සියවසේ මැදභාගයේ දී අකුරුඇමිණීමේ ක්‍රමය සොයාගනු ලැබුවේ ජර්මානුවන් විසිනි.
(5) ජ්‍යොතිෂය, ආයුර්වේදය පිළිබඳ පැරණි පොතපත ඉගෙන ගත යුතු වන්නේ සංස්කෘත භාෂාවෙනි. (........)

[3 වැනි පිටුව බලන්න

## II කොටස

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අධ්‍යාපනයට පදනම් වන ආගමික හා සදාචාරාත්මක අංශ කෙරෙහි බල පවත්නා මනෝ විද්‍යාත්මක කරුණු කෙරෙහි පියාජේ විශේෂ අවධානයක් දැක්වී ය. ඒ අනුව සදාචාර වර්ධනයට බලපාන කරුණු දෙකක් කෙරෙහි ඔහුගේ අවධානය යොමු විය. පුද්ගලයෙකුගේ ජීවිතයේ දී පරතන්ත්‍ර අවස්ථා ද තිබේ. අනුන් අනුගමනය කිරීම එමගින් අපේක්ෂිත ය. පුද්ගලයා තමන් සිතා මතා කටයුතු කරන ස්වතන්ත්‍ර අවස්ථා ද තිබේ. පුද්ගලයෙක් හෘදය සාක්ෂියට අනුකූලව ද ජීවත් වේ. පුද්ගලයකුගේ ජීවිතය කෙරෙහි මෙම ලක්ෂණ දෙක ම බල පවත්වයි. මෙම අංශ දෙකේ ම ක්‍රියාකාරිත්වය පුද්ගල සාරධර්ම කෙරෙහි බල පවත්වයි.

දාර්ශනික සංකල්ප අනුව සදාචාරය පුද්ගල ජීවිතයට විශේෂ මෙහෙයක් ඉටු කරයි. ඒ අනුව පුද්ගල ජීවිතයේ දී සදාචාරය මුල් කල සිට අත්දැකීම් මගින් හෝ අනුකරණයෙන් හෝ ඉගෙනීමෙන් හෝ හුරු කර ගනී. පරතන්ත්‍ර ලෙස අන්‍යයන්ගේ බලපෑමෙන් පුද්ගලයා පාලනය වන්නේ එමගිනි. මේ අනුව සදාචාරය පිළිබඳ ව දරුවන්ට කුඩා කල සිට ඉගැන්විය යුතුවේ. සදාචාරය අනුකරණයෙන් ද කුඩා කල සිට ඉගෙන ගනී. වැඩිහිටි, ගුරුවර, පූජ්‍ය පූජක අවවාද ද, ආදර්ශ ද ඒ සඳහා බලපවත්වයි. දරුවන් සඳහා සදාචාරයේ අර්ථාන්විත දේ හඳුන්වා දිය යුතුය. පසුකලෙක තර්කානුකූල චින්තනය සඳහා නිවැරදි දේ හැඳින්වීම අවශ්‍ය ය. බුද්ධිමය තර්කනය සඳහා අවශ්‍ය හා අදාළ දේ එයට ඇතුළත් විය යුතුය.

සමාජ සාරධර්ම හා ආකල්ප ගොඩ නැගීමේ දී, පවුල, ආගමික ආයතන, පාසල ක්‍රියාකාරි සේවයක් සමාජය හා පුද්ගලයා විෂයයෙහි ඉටු කරයි. පුළුල් සමාජයක පොදු ආකල්ප ගොනු කරන, එක් කරන තැනක් ලෙස පාසල හැඳින්වේ. ඒ අනුව පාසල යනු හුදු ඇනුම් ඒකකයක් ම නොවේ. ඒ සියල්ලෙහි ම මූලික කාරක උපදේශකයා වන්නේ ගුරුවරයා ය. ඔහු සිසුන් අතරට සාරධර්ම ගෙන යන්නා ද, උගන්වන්නා ද වේ.

(i) පියාජේගේ විශේෂ අවධානය යොමු වූ මනෝ විද්‍යාත්මක කරුණු සම්බන්ධ වන්නේ කවර අංශ සමග ද ?

(ii) සදාචාර වර්ධනයට බලපාන කරුණු මොනවා ද?

(iii) පරතන්ත්‍ර අවස්ථා යනුවෙන් මේ ලේඛකයා අදහස් කළේ කුමක් ද?

(iv) පුද්ගල ජීවිතයේ දී සදාචාරය හුරු කරන්නේ කවර ආකාරයෙන් ද?

(v) සමාජය හා පුද්ගලයා විෂයෙහි ක්‍රියාකාරී සේවයක් ඉටු කරන ආයතන මොනවා ද? (ලකුණු 10යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, එහි අග ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ලංකාවේ ජන සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩිවීම නිසා උද්ගත වී ඇති ගැටලු ගණනාවකි. වැඩිවන ජනතාවගේ මූලික අවශ්‍යතා වූ ආහාර, ඇඳුම්-පැළඳුම් සහ නිවාස සපයා දිය යුතු ව ඇත. ඔවුන්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය සහ යහපත සඳහා අවශ්‍ය වන වෙනත් සේවාවන් ද සැපයීමට සිදු වී ඇත. වත්මන් ජීවන තත්ත්වය එසේ ම පවත්වා ගැනීමට හෝ නො එසේ නම් එය දියුණු කිරීමට හෝ හැම අංශයක ම නිෂ්පාදන වැඩි කිරීම අවශ්‍ය ය. ලංකාවේ ආර්ථික තත්ත්වයට මුළුමනින් ම වාගේ පිටුබලය දෙන තේ, රබර්, පොල් යන නිර්යාත භාණ්ඩවල ලෝක වෙළෙඳ පොළෙහි මිල විචලනවීමෙන් උද්ගත වන අහිතකර ප්‍රතිඵල මඟ හරවා ගැනීම පිණිස නිෂ්පාදනය වැඩි කිරීම අත්‍යවශ්‍ය වේ.

නිෂ්පාදනය වැඩි කිරීම උදෙසා කෙරෙන සටනේ දී, පාරම්පරික නිෂ්පාදන ක්‍රම ගැන අපට බලාපොරොත්තු රඳවිය නොහැක්කේ මෙතෙක් කෘෂිකර්මය වැනි ප්‍රධාන අංශ වුවද නිෂ්පාදනයෙහි ලා බොහෝ දුරට නොදියුණු පැරණි ක්‍රම අනුගමනය කරන නිසා ය. කාර්මික හා විද්‍යාඥානයේ ප්‍රගතිය නිසා ඇති වූ උපක්‍රම, ශිල්ප න්‍යායයන් හා උපකරණ යනාදියෙන් ප්‍රයෝජන ගත යුතු යි. නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මේවා සාර්ථක ව උපයෝගී කර ගැනීමට නම් නොයෙක් පුහුණු ශ්‍රමිකයන් යොදා ගැනීම අවශ්‍ය වේ. විශේෂයෙන් ම ඌන සංවර්ධිත රටවල සංවර්ධනය සඳහා සැලසුම් නිර්මාණය කිරීමේ දී කාර්මික අධ්‍යාපනයට අයත් වනුයේ අසාමාන්‍ය ස්ථානයකි. මෙහි දී අධ්‍යාපනය සඳහා, විශේෂයෙන් ම කාර්මික අධ්‍යාපනය සඳහා, වැය කෙරෙන මුදල් කැප වෙන්නේ සමාජ සේවයක් සඳහා නොව වැඩි වශයෙන් ම ප්‍රාග්ධන ආයෝජනයක් සඳහා බව සැලකිය යුතු ය. එවැනි ආයෝජනයකින් නිෂ්පාදනය වැඩිවීම ද දියුණු නිෂ්පාදන ක්‍රම ඇති වීම ද හේතුවෙන් භාණ්ඩ සුලභ වී මිල අඩු වී ප්‍රජාවට පොදුවේ හිතකාමී වූ සේවයක් සැලසීම දක්නට පිළිවන.

(ලකුණු 15යි)

[4 වැනි පිටුව බලන්න

**3.** දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය තුළට ත්‍රිභාෂා සංකල්පය හඳුන්වා දීමේ අවශ්‍යතාව
(ii) නගරාශ්‍රිත ප්‍රදේශවල කර්මාන්තශාලා තැනීමේ ප්‍රතිවිපාක
(iii) ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළට යෝග්‍ය ආකාරයෙන් උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීමේ වැදගත්කම
(iv) කාන්තා හිංසනයෙන් හා ළමා අපචාරවලින් තොර වූ සමාජයක් ගොඩ නැංවීම
(v) පරිගණක අපභාවිතය නිසා නොමඟ යන තරුණ පරපුර
(vi) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා පොදු ජනතාව මුහුණ පාන ගැටලු (ලකුණු 25යි)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

(i) දරුවෝ හොඳින් පාඩම් කරති යි දෙමාපියෝ සිතති.
(ii) ඔවුහු ශ්‍රී ලංකාව නියෝජනය කරන ක්‍රීඩකයන් වෙති.
(iii) ගුරුවරයෙක් වූ සිරිදාස මහතා දක්ෂ සංගීතඥයෙක් ද වෙයි.
(iv) අප විසින් සත්පුරුෂයෝ අගය කරති.
(v) විදේශීය තානාපතිවරු සම්මේලනයට පැමිණ නැත. (ලකුණු 05යි)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරයට** හරවන්න.

(i) ගුරුවරු ශිෂ්‍ය ශිෂ්‍යාවන් යහමඟ යවති.
(ii) විදුහල්පතිතුමා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කරවයි.
(iii) ශ්‍රී ලාංකිකයෝ ජයග්‍රාහී ක්‍රිකට් ක්‍රීඩකයන් හරසරින් පිළිගත්හ.
(iv) මහාචාර්ය සරච්චන්ද්‍රයෝ හෙළ නාට්‍ය කලාව නව මඟකට යොමු කළහ.
(v) නිර්මාණකරුවා ජීවිත පරිඥානයෙන් ලබා ගත් අත්දැකීම් ඇසුරෙන් රසවත් නිර්මාණ ඉදිරිපත් කරයි. (ලකුණු 05යි)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) නවක නිළියගේ විවාහ මංගල්‍යයට කලාකරුවන් මෙන් ම (දේශපාලනඥයෝ/දේශපාලනඥයින්) ද පැමිණ සිටිය හ.
(ii) සුජීවා දක්ෂ (ලේඛිකාවක්/ලේඛිකාවක) බව කවුරුත් පවසති.
(iii) මේ සත්‍යය (ඔවුහු/ඔවුන්) කවදා වටහා ගනිත් ද?
(iv) නවක සිසුන්ගෙන් වැඩි (දෙනෙක්/දෙනෙකු) ශාලාවට රැස්ව සිටිනවා අපි දුටුවෙමු.
(v) මේ ගෙදර වාසය කරන්නෝ (කවුරුද?/කවුරුන් ද?). (ලකුණු 05යි)

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් ලියා** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) ඇගේ **මනස්තාපය** මුහුණින් පිළිබිඹු විය.
(ii) **ආධානග්‍රාහීව** ක්‍රියා කිරීම සමාජයේ ප්‍රගතියට හිතකර නොවේ.
(iii) පාලකයාගේ **ජුගුප්සාජනක** ක්‍රියා කලාපය සැමගේම අප්‍රසාදයට ලක් විය. (ලකුණු 03යි)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) උත්පත්තියෙන් ම ඇස් අන්ධ වූ
(ii) පහතින් ලියන ලද්ද
(iii) යුද්ධය සඳහා අඳින ලෝහමය සැට්ටය. (ලකුණු 03යි)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතරින් තෝරා** ලියන්න.

(i) වැහි වලාවෝ ග්‍රීෂ්මයෙන් පෙළෙන ලෝ වැස්සන්ගේ ........................................................ දුරු කරති.
(ii) නිදහස් අධ්‍යාපනයේ පියා ........................................................ කිරීම අප කාගේත් යුතුකමකි.
(iii) පුද්ගලයන් අතර සාමකාමී සම්බන්ධතාව ........................................................ යි.
(iv) රටක සදාචාරාත්මක දියුණුව උදෙසා කාන්තාව ................................................ කාර්යභාරයක් ඉටු කරන්නීය.
(v) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ ...................................................... ශක්තිය පිළිබඳ ජනතාව විස්මය ප්‍රකාශ කළහ.
(vi) පරිසර සංරක්ෂණය පොදු ජනතාව විසින් ඉටු කළ යුතු ................................................ සේවාවක් ලෙස සැලකේ.
**(සහජීවනය, පරාර්ථකාමී, ස්මරණ, දාහය, අනුස්මරණය, අනුපම, අනුල්ලංඝනීය, මහඟු)** (ලකුණු 03යි)

(ඊ) **තද කළු අකුරෙන් දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

(i) තාපසතුමා **මුව** ධෝවනය කොට අසපුව වෙත පිය නැඟී ය.
(ii) මවගේ **පිය** තෙපුල් දරුවා තුළ සොම්නස දනවයි.
(iii) දියණිය තම මවගේ **පා** සිඹ පති කුලයට ගියා ය.
(iv) තම පර්යේෂණය පිළිබඳ **දළ** සටහනක් විද්‍යාඥයා සභාවට ඉදිරිපත් කළේ ය.
(v) ගං **තෙර** අසළට පැමිණි හේවායා සෙමෙන් අසු පිටින් බැස්සේ ය.
(vi) මව තම දරුවා **කර** පින්නා ගෙන පෙරහැර නරඹයි. (ලකුණු 06යි)

**6.** තද කළු අකුරින් දක්වා ඇති පද කුමන ව්‍යාකරණ අංගයකට අයත් දැයි දක්වන්න.

(i) මුහුදුදියෙහි **පිහිනමින්** සිටි ඇතමෙකු වෙරළට පැමිණයේ විවේක ගනු **පිණිස** ය.

(ii) පොළොන්නරු යුගයේ දී විද්‍යාචක්‍රවර්ති **ලියූ** බුත්සරණ ඇතැම් **පශ්චාත්කාලීන නිර්මාණවලට** පිටිවහලක් විය.

(iii) එස්. මහින්ද හිමි **විජාතිකයෙකු** වුව ද සිංහල කවීන් අතර **ශ්‍රේෂ්ඨත්වයට** පත් වූයේ ලක්වාසීන් උදෙසා සිදු කළ **අත්‍යුදාර** මෙහෙවර නිසා ය.

(iv) ඉකුත් දශකයේ දී **ළමා චිත්‍රපට** නිෂ්පාදනයට **සිනමාකරුවන්ගෙන් සැපයුණු** දායකත්වය සතුටුදායක ය.

(v) සන්දේශ කාව්‍යවල අන්තර්ගත **ස්වභාවෝක්ති** වර්ණනා කාව්‍ය **රචකයන්ගේ** නිසර්ග කවිත්වය පිළිබිඹු **කරන** කැටපතක් බව විචාරකයන්ගේ මතයයි. (ලකුණු 15යි)

**7.** (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත්** ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) යම්කිසි දෙයක් ලබා ගැනීමට පවත්නා දුෂ්කරතාව

(ii) එකට වාසය කරමින් හතුරුකම් කිරීම

(iii) ස්වකීය අප්‍රසාදය ක්‍රියාවෙන් පළ කිරීම

(iv) පිහිටක් සොයා ගිය තැනින් විපතක් සිදු වීම

(v) වැරදි නිවැරදි දෙපක්ෂයට ම එක ම දඬුවමක් දීම

(vi) සුදුසුසන් නැති තැන්හි නුසුදුස්සන්ට තැන ලැබීම (ලකුණු 03යි)

(ආ) පහත දී ඇති **රූඪී**වල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.

| | |
|---|---|
| (i) අතිරසත් තිත්ත වීම | (ii) ඉණිමඟට පයින් ගැසීම |
| (iii) කල දුටු කල වළ ඉහ ගැනීම | (iv) කළුනික සෙවීම |
| (v) සායම ගිහිල්ලා | (vi) ගිය ලූලා මහ ලූලා |

(ලකුණු 03යි)

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල** පද සෑදී ඇති රටාව කුමක් දැයි දක්වන්න.

| | |
|---|---|
| (i) යාන - වාහන | (ii) හඬා - දොඬා |
| (iii) යාම් - ඊම් | (iv) නහින - දෙහින |
| (v) කවා - පොවා | (vi) තක්කු - මුක්කු |

(ලකුණු 03යි)

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික** ව්‍යවහාර සඳහා **පොදු භාවිතයේ යෙදෙන** පද ලියා දක්වන්න.

| | |
|---|---|
| (i) කුරියං | (ii) හේයනවා |
| (iii) තුලාන | (iv) බුන්නා |
| (v) හින්නා | (vi) හේමලයා |

(ලකුණු 03යි)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික** ව්‍යවහාර සඳහා **පොදු භාවිතයේ** යෙදෙන අරුත් ලියන්න.

| | |
|---|---|
| (i) පේ කරනවා | (ii) මයක්කම |
| (iii) ඔරසන් කියනවා | (iv) නඩේගුරා |
| (v) කොළ ගොන් ගහනවා | (vi) දෝනාව |

(ලකුණු 03යි)

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උගත්පුද්ගලයන්අතරසේවාවියුක්තියෙහිඅඩුවීමදිරිමත්කරවනසුළුවර්ධනයකිඅපොසඋසස්පෙළසහර්ටවැඩිඅධ්‍යා
පනසුදුසුකම්සහිතපුද්ගලකාණ්ඩයතුලසේවාවියුක්තිය2011වසරේපැවතිසියයට9හිසිට2012වසරේදීසියයට7.5දක්
වාඅඩුවියකෙසේවුවදඉහලමසේවාවියුක්තිඅනුපාතිකයවාර්තාකළමෙමකාණ්ඩයටපසුවවැඩිමසේවාවියුක්තිඅනු
පාතිකයවාර්ථාවීඇත්තේඅපොසසාමාන්‍යපෙළසුදුසුකම්සහිතපුද්ගලකාණ්ඩයඅතරයමෙමකාණ්ඩයේසේවාවියුක්
තිය2011වසරේදීපැවතිසියයට5.2හිසිට2012වසරේසියයට6ක්දක්වාඉහලනැගිණි2012වසරේදීසමහරවයස්කාණ්ඩ
යන්සඳහාසේවාවියුක්තියපහළගියදතරුණසේවාවියුක්තියඉහලඅගයකපැවතිණි

(i) ඉහත ඡේදය ශාස්ත්‍රීය යැයි බොහෝ සෙයින් ම පිළිගත් ක්‍රමය අනුව පද බෙදා අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත උපුටා දක්වන්න.

(ii) මෙම ඡේදයේ අක්ෂර වින්‍යාසය දොස් සහිත වචන ඇත්නම් නිවැරදි කරන්න.

(iii) පහත දැක්වෙන පදවල විරුද්ධාර්ථ දක්වන්න

(අ) සේවා වියුක්තියෙහි (ආ) දිරිමත්

(iv) **මූර්ධජ 'ණ්' කාරය, ඉස්පිල්ල සහිත මූර්ධජ 'ණ' කාරය, 'ර්' කාරය, කොම්බුව සහිත 'ර්' කාරය** ඇතුළත් එක් වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

(v) **ඉස්පිලි තුනක් ද, පාපිලි තුනක් ද, ඉස්පිලි දෙකක් ද, ඉස්පිල්ල, පාපිල්ල, ඉස්පිල්ල** ද අනු පිළිවෙළින් යෙදූ එක් වචනය බැගින් ලියන්න. (ලකුණු 15යි)

***